ශ්‍රී ලංකා ජනාධිපති

இலங்கை சனாதிபதி

**President of Sri Lanka**

## ශෝක පණිවුඩය

අන්තර්ජාතිකව සම්භාවනාවට පත් ආසියානු සිනමාවේ දැවැන්ත ත්‍රිමූර්තිය වන, ජපානයේ අකිරා කුරොසාවා සහ ඉන්දියාවේ සත්‍යජිත් රායිට අනතුරුව ශ්‍රී ලංකාවේ ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් සූරීන්හු ද සිය දිවිසැරියෙන් නික්ම යනුයේ, තවත් සියවස් ගණනාවකට විශ්ව සිනමාවේ ආසියානු කලාපීය විශිෂ්ටත්වය පිළිබඳ අභිමානනීය මතකය සදානුස්මරණීය ස්මාරකයක් බවට පත්කරමිනි.

එක්දහස් නවසිය පනස්හයේ, විප්ලවීය පෙරළිය සිනමාව විෂයෙහි ප්‍රක්ෂේපණය කෙරුණු "රේඛාව" චිත්‍රපටයෙන් ඇරැඹුණු ලෙස්ටර් ජේම්ස් පීරිස් නම් දැවැන්ත මහතිර දැක්ම එලෙස සමාප්තියට පත්වනුයේ, සියවසක් අබිමුව තෙක් දිගහැරුණු  කියවා නිමකළ නොහෙන මහා පුරාවතක් පරිද්දෙනි.

ලෙස්ටර් ජේම්ස් පීරිස් යනු නිසැකවම සංස්කරණය නොකෙරුණු සංකීර්ණ තිර පිටපතක් බඳු චරිතාපදානයකි. රේඛාව ඔස්සේ ග්‍රාමීය ජනජීවිතයේ විශ්වාසයන් කැමරා රූපරාමු ඔස්සේ ප්‍රශ්න කරන හෙතෙම "නිධානය, රන්සළු, දෙලොවක් අතර, අහසින් පොළොවට" සමග පුද්ගලානුබද්ධ මනෝභාවයන් සමග සමීප ගනුදෙනුවක නිරත වන්නේය. "සන්දේශය, වීර පුරන්අප්පු, ගෝඩ්කිං" සමග ඉතිහාසය රූපණයට කැඳවන වියත් බහුශ්‍රැතයා, "ගම්පෙරළිය, කලියුගය සහ යුගාන්තය" කැටුව දේශපාලනික සහ සමාජයීය පිපිරුමක පසු කම්පනයන් සිනමාත්මක සංධ්වනියක් බවට පත්කරයි.

ලෙස්ටර් ජේම්ස් පීරිස් නම්, සමස්ථාර්ථය තුළ අප දකිනුයේ භෞතිකව නොව ආධ්‍යාත්මිකව ද සිනමාත්මක දැක්මෙන්ද විශාලනය වූ  යෝධ සිනමා සිත්තමකි. ඔහු අපව ජාත්‍යන්තරය කරා රැගෙන ගියේය. අපව සම්මානිතයන් බවට පත්කළේය. අවසන ඔහු දහවලෙහි කීර්තිය අප වෙත රඳවා රාත්‍රියක් සේ නික්ම ගියේය.

ඒ සමග ලාංකීය සිනමා කලා සාහිත්‍යාංග ධාරාවේ යුග පුරුෂ පද්ධතියේ බිඳවැටීමක් සනිටුහන් වූ අයුරක් ද ගම්‍ය වේ. මාර්ටින් වික්‍රමසිංහ, එදිරිවීර සරච්චන්ද්‍ර, පණ්ඩිත් අමරදේව, ජෝර්ජ් කීට් සහ ආචාර්ය ලෙස්ටර් ජේම්ස් සූරීන් බඳු ප්‍රාමාණිකයන්ගේ අභාවයෙන් පසු මේ සලකුණු වන රික්තය තුළ අප අපේක්ෂා සහගත විය යුත්තේ අනුප්‍රාප්තික පරපුරේ ආගමනයයි.

ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් අද්විතීය සිනමාවේදියාණන්ගේ අභාවය පිළිබඳව මාගේ දැඩිතර සංවේගය සුමිත්‍රා පීරිස් මහත්මියටත් පවුලේ සමීපතමයන්ටත් සමස්ත ශ්‍රී ලංකාවාසීන් වෙතත් පළකරන අතර, ඒ මහතාට මොක්සුව පතමි.

මෛත්‍රීපාල සිරිසේන

2018 මැයි මස 01 වන දින